**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳවඅවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින්කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ ගොඩනැගිලි නඩත්තු වියදම් ප්‍රාග්ධනිත කිරීමේ වරද නිවරදි කිරීමේදී එම නඩත්තු වියදමට ගලපා තිබුණු රු.1,139,058 ක් වූ ක්ෂය වටිනාකම, ප්‍රවර්ථන වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩුකර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාළ ක්ෂය ඉවත් කිරීම අතපසුවීමකින් සිදුවී ඇති අතර 2021 වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල නිවැරදි කිරීම සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | අදාළ ගැලපීම නිවැරදි ලෙස සිදු කළ යුතුවේ. |
| (ආ) | කොමිෂමේ අරමුදල් යොදා ගනිමින් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ වැයකරන ලද රු. 24,868,093 ක් රජයේ ප්‍රදාන යටතේ වියදමක් ලෙස ශුද්ධ ලාභයට පසුව ගලපා ඉදිරිපත් කර තිබුණි. මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන කෙරීගෙන යන වැඩ සඳහා වැය කර තිබුණු රු. 4,241,838 ක්ද අයභාර වියදමක් ලෙස සලකා | මීට පෙර වසර වලදී ඉදිරිපත් කල ආකාරයටම ව්‍යාප්‍රති වලට වියදම් විස්තර ඉදිරිපත් කර ඇති අතර 2021 වසරේ මල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී තව දුරටත් විස්තරාත්මකව ඉදිරිපත් කිරීම සටහන් කර ගන්නා ලදී. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

ආදායමට ලියාහැර තිබීම නිසා කොමිෂන් සභාවේ ලාභය හා කෙරීගෙන යන වැඩ එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල**

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් වත්කම් වල වටිනාකම වාර්ෂික ක්ෂය වීම, අගය වැඩිවීම් හෝ අපහරණය කිරීම පිළිබඳව පරීක්ෂා කල හැකි වන පරිදි වෙන් වෙන්ව සටහන් කර ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අදාල විස්තර සහිතව වත්කම් ලේඛනය පිලියෙල කරමින් පවති | අදාල ලේඛන නිසි පරිදි පවත්වා ගත යුතුවේ. |
| (ආ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | කොමිෂන් සභාව විසින් කළමනාකරණ සහකාරිනියක් 2020 ඔක්තෝම්බර් 12 දින සිට ප්‍රවාහන අමාත්‍යාංශයේ සේවයට මුදා හැර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.442,932 ක් ගෙවා තිබුණි. | ප්‍රවාහන අමාත්‍යාංශයේ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහය කාර්ය මණ්ඩලය වෙත අදාල නිළධාරනිය නිදහස් කර ඇත. | ඒ සඳහා අදාල ගෙවීම් ප්‍රතිපූර්ණය නිසි පරිදි කල යුතුවේ. |
| (ඇ) අංක :පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1.2 වගන්තිය | භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවක රක්ෂණ හා අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රු.6,744,070 ක් වැයකර තිබුණි. | මේ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. එමෙන්ම ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් සේවක සුභසාධනය සඳහා අනුග්‍රහය දැක්වීමට අවස්ථාව ලබාදී ඇත. | භාණ්ඩාගාර අනුමැතිය මේ සඳහා ලබාගත යුතු වේ. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 (2) (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයකට සීමා විය යුතු වුවද, එම සීමාව ඉක්මවමින් 2020 වර්ෂය තුල අවස්ථා 7 කදී, එකතුව රු.1,678,155 ප්‍රමාණයක් අත්තිකාරම් ලබාදී තිබුණි. | සේවක සුභසාධක කටයුතු සඳහා ගෙවීම් කිරීමේදී අවම මුදල් අත්තිකාරම් ලබාදීමට සටහන් කර ගන්නා ලදි. | අදාල මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,894,353 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.172,514,031 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.193,408,384 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායමේ රු.175,996,143 ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් තුල ඇතුලත් මාර්ග බලපත්‍ර ආදායම , මාර්ග බලපත්‍ර අලුත්කිරීමේ ආදායම සහ මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායම පිලිවෙලින් සියයට 93 කින්, සියයට 48කින් හා සියයට 57 කින් අඩු වී ඇත.

- කොමිෂන් සභාවේ සේවක පාරිශ්‍රමික වියදම් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 දී සියයට 1.74කින් වැඩිවී ඇත.

## 2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.27 ක් වන අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 0.26 ට සාපේක්ෂව වැඩි අගයක්ව පැවතීම අයහපත් තත්වයක් ලෙස නිරීක්ෂණය වේ.

- සමාලෝචිත වර්ෂයේ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 44 කින් අඩුවී තිබෙන බව නිරීක්ෂණය වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරෝනා වසංගතයෙන් අඩපණ වූ අන්තර් පළාත් බස් රථ ධාවන කටයුතු යථා තත්වයට පත් කිරීම සඳහා සහන ලබා දීමේදී මාර්ග බලපත්‍ර ආදායම මුළුමනින්ම අය නොකිරීම නිසා රු.186,850,808 ක ආදායමක් කොමිෂන් සභාවට අහිමි වී තිබුණි. | 2020 මාර්තු, අප්‍රේල්, මැයි මාස වලදී මගී සේවා අවසර පත්‍ර යාවත්කාලීන කිරීමේ ගාස්තු, ටෙන්ඩර් ගාස්තු, අධිවේගී මාර්ගයේ තාවකාලික අවසර පත්‍ර ගාස්තු, ලොග් පත්‍ර ගාස්තු හා ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමට 49/2020 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇත. එසේම බස් රථ ධාවන කටයුතු ජුනි මස ආරම්භ වුවත් එම අවස්ථාව වන විටත් ධාවන කටයුතු යථා තත්ත්වයට පත් නොවී තිබු බැවින් අධ්‍යක්ෂ මණ්ඩල | අදාල කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගත යුතු අතර නිසි පරිදි කැබිනට් අනුමැතිය ලබා ගත යුතුවේ. |

පත්‍රිකා අංක:51/2020 මගින් හා 120/2020 මගින් සැප්තැම්බර් මාසය දක්වාද සහන ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණ.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | කොමිෂන් සභාව මගින් බස් සමාගම් වෙත නිකුත් කර ඇති කාර්යාල උපකරණ හා පරිඝණක උපාංග අයිතම් ඒකක 117 ක් සමීක්ෂණය කිරීමට, සියලු වත්කම් සඳහා හඳුනා ගැනීමේ අංකයක් යොදා සෑදීමට සහ අංක නොමැති අයිතම 519 ක් සමීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම අයිතම ඒකක 67ක් සමීක්ෂණයේදී හඳුනා ගැනීමටද නොහැකි වී තිබුණි. | වත්කම් අංක සටහන් කිරීමට කටයුතු කරමින් පවතී. | කොමිෂන් සභාව මගින් බස් සමාගම් වෙත නිකුත් කර ඇති උපකරණ සඳහා නිසි පරිදි අංක යොදා වාර්තා තබාගත යුතුවේ. |
| (ii) | කොමිෂන් සභාව විසින් 2020 වසර තුල ටෙන්ඩර් මගින් නව බලපත්‍ර නිකුත් කිරීම වෙනුවට දෛනික පදනමින් බලපත්‍ර නිකුත් කිරීම නිසා ලැබිය යුතු ආදායමක් අහිමිවී තිබුණි. තවද මෙම හේතුව නිසා වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබූ බස් රථ 3040ක සංඛ්‍යාවකින් GPS පද්ධති සවි කිරීමට බස් රථ 1159 ක් හෙවත් සියයට 38 ක සංඛ්‍යාවකට පමණක් සිදුකර තිබුණි. | එකඟ වේ. | අදාල නියමයන්ට අනුව බස් රථ වල GPS සවිකල යුතුවේ. |